# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2313/26 - 2023 ජනවාරි මස 03 වැනි අඟහරුවාදා - 2023.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ වූ නියෝගය

නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර අනුරාධා යහම්පත් වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල මත පහත සඳහන් නියෝගය මෙයින් දන්වා සිටිමි.

**අනුරාධා යහම්පත්,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2023 ජනවාරි මස 02 වැනි දින,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
ඔර්ස්හිල්,
ත්‍රිකුණාමලය.

**නියෝගය**

නැගෙනහිර පළාතට අයත් මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සහ අම්පාර දිස්ත්‍රික්කයේ නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරුන් විසින් 2023 වර්ෂය සඳහා අයවැය ලේඛන ලියකියවිලි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 සහ 169 වගන්ති අනුව ඉදිරිපත් කරනු ලැබ, එය සම්මත නොකරනු ලැබූ හේතුවෙන් සහ 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වැනි වගන්තිය අනුව කටයුතු නොකිරීම හේතුවෙන්, කෝරලෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය 2022.12.30 වැනි දින හා නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය 2022.12.31 වැනි දින සිට සභාපතිවරුන් ස්වකීය සභාපති ධූරයෙන් ඉල්ලා අස්වූවා සේ සලකා, ඒ දින සිට බලපැවැත්වෙන පරිදි අදාළ සභාවල සභාපති ධූර පුරප්පාඩු පවතින බව සැලකේ.


1A - PG 6145 — 07 (2023/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

1987 වසරේ අංක 15 දරන ප්‍රාදේශී සභා පනත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 171 (ආ) වගන්තිය යටතේ මා වෙත ලබා දී ඇති බලතල අනුව, නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර අනුරාධා යහම්පත් වන මම, භාණ්ඩ, මූල්‍ය පරිපාලනය හා ඒ සම්බන්ධව අතර මැදි කරුණු පිළිබඳව මෙම පනත එහි සවිස්තර කාල පරාසය තෙක් පහත සඳහන් නීති ක්‍රියාත්මක කිරීමට මෙමඟින් බලය පවරමි.

**අනුරාධා යහම්පත්,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2023 ජනවාරි මස 02 වැනි දින,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
ඔර්ස්හිල්,
ත්‍රිකුණාමලය.

**නීතිය**

නැගෙනහිර පළාතට අයත් මඩකලපුව දිස්ත්‍රික් සීමාව තුළ පිහිටි කෝරලෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ හා අම්පාර දිස්ත්‍රික් සීමාව තුළ පිහිටි නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ අයවැය වාර්තාව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 සහ 169 යන උපඡේදවල අවශ්‍යතාව අනුව සම්මත කිරීමට අපොහොසත් වීම හේතුවෙන් කෝරලෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ හා නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරුන්ගේ තනතුරු 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වැනි කොටසට අනුව පුරප්පාඩු වී ඇත. ඒ අනුව 2012 වසරේ අංක 22 වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතට අනුව මෙමගින් කෝරලෙයිපත්තු හා නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා වන අයවැය යෝජනා ලබාදීම සඳහා පුරප්පාඩු වී ඇති සභාපති තනතුරු සඳහා පත් කිරීම් සිදුකළ හැකිය. එම නිසා මම මඩකලපුව පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත කෝරලෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ හා අම්පාර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ ඉහත සඳහන් අයවැය කෙටුම්පතට අනුව පහත සඳහන් යෝජනා වගුවේ සඳහන් කටයුතු 2022.12.30 දින සිට පුරප්පාඩුව ඇති කෝරලෙයිපත්තු හා 2022.12.31 දින සිට පුරප්පාඩුව ඇති නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ සභාපති තනතුරු සඳහා වන පත්කිරීම් සිදුකරන තෙක් සිදුකිරීමට බලය ලබාදෙමි.

යෝජනා :

01. වැටුප් හා ගෙවීම්
02. ගමන් වියදම්
03. ලිපි ද්‍රව්‍ය
04. පුනරාවර්තන වියදම්
05. එල්ඩීඑස්පී හා සීඩීඑල්ජී ව්‍යාපෘති සම්බන්ධ වියදම්
06. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන

EOG 01 - 0009/1

---

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 247 වගන්තිය යටතේ වූ නියෝගය

නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර අනුරාධා යහම්පත් වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 247 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල මත පහත සඳහන් නියෝගය මෙයින් දන්වා සිටිමි.

**අනුරාධා යහම්පත්,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2023 ජනවාරි මස 02 වැනි දින,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
ඔර්ස්හිල්,
ත්‍රිකුණාමලය.

**නියෝගය**

නැගෙනහිර පළාතට අයත් මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර් නගර සභාවේ සභාපතිවරයාගේ 2023 වර්ෂය සඳහා අයවැය ලේඛන ලියකියවිලි නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 178 සහ 178(අ) වගන්ති අනුව ඉදිරිපත් කරනු ලැබ, එය සම්මත නොකරනු ලැබූ හේතුවෙන් සහ 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 12 වගන්තිය අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2022.12.31 වැනි දින සිට සභාපති ස්වකීය සභාපති ධූරයෙන් ඉල්ලා අස්වූවා සේ සලකා, එදින සිට බලපැවැත්වෙන පරිදි අදාළ සභාවේ සභාපති ධූරය පුරප්පාඩු පවතින බව සැලකේ.

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

නගර සභා ආඥාපනත (255 අධිකාරය)

නගර සභා ආඥාපනත (255 අධිකාරය) 193(2) වගන්තිය යටතේ මා වෙත ලබාදී ඇති බලතල අනුව, නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර අනුරාධා යහම්පත් වන මම, භාණ්ඩ, මූල්‍ය පරිපාලනය හා ඒ සම්බන්ධව අතරමැදි කරුණු පිළිබඳව මෙම පනත එහි සවිස්තර කාල පරාසය තෙක් පහත සඳහන් නීති ක්‍රියාත්මක කිරීමට මෙමගින් බලය පවරමි.

**අනුරාධා යහම්පත්,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2023 ජනවාරි මස 02 වැනි දින,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
ඔර්ස්හිල්,
ත්‍රිකුණාමලය.

**නීතිය**

නැගෙනහිර පළාතට අයත් මඩකලපුව දිස්ත්‍රික් සීමාව තුළ පිහිටි ඒරාවූර් නගර සභාවේ 2023 වර්ෂයට අදාළ අයවැය වාර්තාව නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 178 සහ 178 (අ) යන උපඡේදවල අවශ්‍යතාව අනුව සම්මත කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ඒරාවූර් නගර සභාවේ සභාපතිවරයාගේ තනතුර 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 12 වැනි කොටසට අනුව පුරප්පාඩු වී ඇත. ඒ අනුව 2012 වසරේ අංක 22 වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතට අනුව මෙමගින් ඒරාවූර් නගර සභාවේ 2023 වර්ෂය සඳහා වන අයවැය යෝජනා ලබාදීම සඳහා පුරප්පාඩුවී ඇති සභාපති තනතුර සඳහා පත් කිරීම් සිදුකළ හැකි ය. එම නිසා මම මඩකලපුව පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත 2022 ඉතිරි කාලය සඳහා ඇතිවෙන වියදම් සහ ඉහත සඳහන් අයවැය කෙටුම්පතට අනුව 2023 වර්ෂය සඳහා පහත සඳහන් යෝජනා වගුවේ සඳහන් කටයුතු 2022.12.31 දින සිට පුරප්පාඩුව ඇති ඒරාවූර් නගර සභාවේ නව සභාපති තනතුර සඳහා වන පත්කිරීම් සිදුකරන තෙක් සිදු කිරීමට බලය ලබාදෙමි.

යෝජනා ඃ

01. වැටුප් හා ගෙවීම්
02. ගමන් වියදම්
03. ලිපි ද්‍රව්‍ය
04. පුනරාවර්තන වියදම්
05. එල්ඩීඑස්පී හා සීඩීඑල්ජී ව්‍යාපෘති සම්බන්ධ වියදම්
06. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන

EOG 01 - 0009/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.